ශ්‍රී රාහුල විද්‍යාලය/කටුගස්තොට
ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයන
10 ශ්‍රේණිය A/B

සැකසුම-Y.A.H.සේනාරත්න. කාලය පැය 2

පහත දක්වා ඇති ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයන පෙළ පොතේ පිටු කියවා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## 3.2 යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීම

මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට සංවිධාන කළ හැකි විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන පිළිබඳ ඉහතින් සාකච්ඡා කර ඇත. ව්‍යාපාරිකයන් විසින් එවැනි ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක කිහිපයක් පහත දැක්වේ.

- අරමුණ අනුව
- පරිමාණය අනුව
- කළමනාකරණ කටයුතු සිදු කරනුයේ කවුරුන්ද යන්න අනුව

## අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම

ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් පදනම් වේ.

- ලාභ ලැබීමේ අරමුණ
- සමාජ සුභසාධන අරමුණ

### ලාභ ලැබීමේ අරමුණ

බොහෝ ව්‍යාපාරිකයෝ ලාභ ලැබීමේ අපේක්ෂාවෙන් ව්‍යපාර කටයුතු කරගෙන යති. ලාභය උපරිම කිරීම මෙම ව්‍යාපාරිකයන්ගේ අරමුණ වේ.

ඉහත සඳහන් කළ ව්‍යාපාර සංවිධාන අතුරින් තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් හා රාජ්‍ය සමාගම් ආදිය ආරම්භ කරන්නේ ලාභ අරමුණු කර ගෙන ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

### සමාජ සුභසාධන අරමුණ

මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරමින් සමාජ සුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන ද ක්‍රියාත්මක වේ. එවැනි සංවිධාන සාමාජිකයන්ගේ සුභසිද්ධිය සඳහා කටයුතු කිරීම, විපත් හා අසහනයට පත් වූ ජනතාවට සහන සැලසීම වැනි අරමුණු පාදක කරගනී. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ද මෙවැනි ව්‍යාපාර ක්‍රියාත්මක වේ.

**නිදසුන් :-**

- ☆ ගොවි සමිති, ක්‍රීඩා සමිති, මරණාධාර සමිති වැනි සමිති ව්‍යාපාර
- ☆ සමූපකාර සමිති
- ☆ රාජ්‍ය දෙපාර්තමේන්තු

මේ අනුව ව්‍යාපාරිකයා තමා අපේක්ෂා කරන අරමුණ මත සුදුසු ව්‍යාපාර වර්ගය තෝරා ගත යුතු ය.

## පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම

ව්‍යාපාර වර්ගයක් තෝරා ගැනීමේ දී එහි පරිමාණය පිළිබඳ ව ද සලකා බැලිය යුතු ය. ව්‍යාපාරයක පරිමාණය තීරණය කිරීම සාධක කිහිපයක් මත රඳා පවතී. අයිතිකරුගේ මූල්‍ය ශක්තිය, කුසලතා හා පළපුරුද්ද සහ විවිධ සබඳතා ඒවා අතර ප්‍රධාන වේ. මීට අමතර ව ව්‍යාපාරය නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, නිෂ්පාදනයට අදාළ වෙළෙඳපළ කොටස ආදී සාධක ද ව්‍යාපාරයේ පරිමාණය තීරණය කිරීමේදී සලකා බැලිය යුතු ය.

මේ අනුව ප්‍රධාන වශයෙන් පරිමාණය අනුව ව්‍යාපාර වර්ග දෙකක් හඳුනා ගත හැකි ය.

- සුළු පරිමාණ ව්‍යාපාර
- මහා පරිමාණ ව්‍යාපාර

### සුළු පරිමාණ ව්‍යාපාර

බොහෝවිට ව්‍යාපාරයක් මුලින් ම ආරම්භ කරනුයේ සුළු පරිමාණ ව්‍යාපාර වශයෙනි. බොහෝ සුළු පරිමාණ ව්‍යාපාර ඒක පුද්ගල ව්‍යාපාර වේ. සුළු ප්‍රාග්ධනයකින්, අවම නීතිමය බලපෑම් යටතේ ආරම්භ කළ හැකි වීම හා තමාගේ දක්ෂතා උපරිම කිරීමට හැකි වීම ආදිය තනි පුද්ගල ව්‍යාපාරයක් තෝරා ගැනීමට හේතු වේ.

### මහා පරිමාණ ව්‍යාපාර

මහා පරිමාණයේ ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි වන්නේ ව්‍යාපාරිකයා සතු ව විශාල සම්පත් ප්‍රමාණයක් පැවතීම, වෙනත් ව්‍යාපාරවල සේවය කිරීමෙන් ලද පළපුරුද්ද, ව්‍යාපාර සඳහා දිරි ගැන්වීම් ලබා දෙන ජාල සබඳතා පැවැතීම හා රජයෙන් සැපයෙන යටිතල පහසුකම් හා වෙනත් දිරිගැන්වීම් ලබා දීම වැනි සාධක මත ය.

## කළමනාකරණය සිදු කරනුයේ කවුරුන් ද යන්න අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම

කළමනාකරණය යනු ව්‍යාපාරයක් සතු සම්පත් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මග පෙන්වීම හා පාලනය කිරීම තුළින් ව්‍යාපාරයේ අරමුණු ඉටු කරගැනීම සඳහා කටයුතු කිරීමේ ක්‍රියාවලියකි.

ඒක පුද්ගල ව්‍යාපාරයක බොහෝවිට අයිතිකරු විසින් ම කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ. ඔහුට ව්‍යාපාරයේ සියලු ම කටයුතු සඳහා නිදහසේ තීරණ ගැනීමේ හැකියාව ඇත. එමෙන් ම ඔහු ව්‍යාපාරයේ අයිතිකරු, නායකයා සහ කළමනාකරු ද වේ.

මෙහිදී අයිතිකරු ලෙස අරමුදල් සම්පාදනය හා ආයෝජනය පිළිබඳ තීරණ ගැනීමේ නිදහස පවතී. එසේ ම නායකයෙකු ලෙස සම්පත් මෙහෙයවීම පිළිබඳ ස්වාධීන තීරණ ගත හැකි වේ.

ව්‍යාපාරයක කළමනාකරණ කටයුතු පුද්ගලයන් කිහිප දෙනෙකු මගින් සිදු කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් හවුල් ව්‍යාපාර සංවිධානයක් හෝ සංස්ථාපිත සමාගමක් තෝරා ගැනීම උචිත වේ. මෙහිදී හවුල්කරුවන් සියලු දෙනාගේ ම කැමැත්ත මත ව්‍යාපාරය සම්බන්ධ තීරණ ගැනීමට හැකියාව ලැබේ.

## 3.3 ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම

ඒක පුද්ගල ව්‍යාපාරයක් අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාර නාමය පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.

**නිදසුන :-**

ගයාල් පෙරේරාගේ ව්‍යාපාරය " ගයාල් " නමින් පවත්වාගෙන යන්නේ නම් ව්‍යාපාර නාමය ලියාපදිංචි කළයුතු වේ.

මෙහිදී සිදුවන්නේ ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම පමණකි. එමගින් ව්‍යාපාරය සඳහා නෛතික පුද්ගලභාවයක් හිමි නොවේ.

ප්‍රශ්නාවලිය

1. යෝග්‍යය ව්‍යාපාර සංවිධානය ක්‍රමයක් තොරා ගැනීමේදී සලකා බලන කරුනු මොනවාද?
2. අරමුණ අනුව ව්‍යාපාර වර්ග කලහැකි ආකර නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න.
3. ව්‍යාපාර පරිමාණය තිරණය කිරීමේදී යොදාගන්නා නිර්ණායක මොනවාද?
4. පරිමාණය අනුව ව්‍යාපාර වර්ගකල හැකි ආකාර නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න.
5. කලමනාකරණය යනු කුමක්ද?
6. ව්‍යාපාරයක කලමනාකරණය සිදුකරන පාර්ශ්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය වෙනස් වන්නේ කෙසේද ?
7. "ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචිය අනිවාර්යවේ" ඉහත ප්‍රකාශයට ඔබ එකගවන්නේද? හේතු දක්වන්න.
8. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචිය මගින් ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලැබෙන්නේද?

ප්‍රශ්නවලට පිලිතුරු සැපයීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමුකරන්න

- පිලිතුරු තමන්ගේ සටහන් පොතේ ලියා දක්වන්න.
- එම පිලිතුරු පාසල ආරම්භ කල පසු පාසලට පැමිණෙන විට රැගෙන ආ යුතුය.
- 2020/05/25 දිනට පෙර ඉහත පැවරුම නිමකලයුතුය.